**ආයුර්වේද වෛද්‍ය සභාව - 2016**

**------------------------------------------**

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 3 කොටසෙහි 21 බී සහ 21 සී වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000–1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද වෛද්‍ය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ III වන කොටසේ II (1) (ඉ) වගන්තිය. | ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරු තිදෙනෙකු සභාවේ සාමාජිකයින් ලෙස පත් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම සාමාජිකයින් තිදෙනා පත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2005 ජූලි 05 දිනැති අංක 14/13/08 (03) දරන ආයුර්වේද වෛද්‍ය සභා පත්‍රිකාව | සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් වර්ෂ 05 කට වරක් ලියාපදිංචිය යාවත්කාලීන කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලියාපදිංචිය වර්ෂ 05 ඉක්මවූ වෛද්‍යවරු 15,644 ක් ලියාපදිංචිය අළුත්කර නොතිබුණු බැවින් සභාවට අහිමිව තිබුණු ආදායම රු.16,402,500 ක් විය. ලියාපදිංචිය යාවත්කාලීන කරවා ගැනීමට විධිමත් ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 169 | 2006 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී ලැබී තිබුණු එකතුව රු.9,780 ක්වූ මුදල් ඇණවුම් 27 ක් උපලබ්ධි කර නොගෙන සේවා සපයා තිබුණු අතර එම මුදල් ඇණවුම් 27 හි මුල් පිටපත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 371(2) | තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් 07 දෙනෙකු වෙත නිකුත් කර තිබුණු රු.199,750 ක අතුරු අග්‍රිම දින 05 සිට දින 18 ක ප්‍රමාද කාලයක් සහිතව පියවා තිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 751 | සමාලෝචිත වර්ෂය තුළදී මිලදීගෙන තිබුණු පිරිවැය රු.23,828 ක්වූ ලිපිකරු පුටු 04 ක්, පිරිවැය රු.314,548 ක් වූ වානේ කැබිනට් 16 ක් හා පිරිවැය රු.34,552 ක් වූ වානේ අල්මාරි 02 ක් බඩු ලේඛන පොත්වල ඇතුළත් කර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.5,936,355 ක් වූ දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් 2017 ජුනි 30 දින වන විටත් භෞතික සමීක්ෂණ සිදුකර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 12:2:1, 12:2:2 හා 12:2:3 වගන්ති | වැඩබැලීමට පත්කරන තනතුර නිත්‍ය තනතුරට ඉහළ තනතුරක් විය යුතු වුවද, ලේඛකාධිකාරි තනතුරේ වැඩ බැලීම සඳහා 2013 ජූලි මාසයේ සිට වෛද්‍ය නිලධාරියෙකු පත්කර තිබුණි. 2017 ජූලි මාසය වන විට වර්ෂ 04 ක් ගතවී තිබුණද, එම තනතුරට නිත්‍ය නිලධාරියෙකු පත්කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,153,359 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.712,624 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.440,735 කින් වර්ධනයවී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව රජයේ ප්‍රතිපාදන රු.750,000 කින් හා වෛද්‍යවරු ලියාපදිංචි කිරීමේ ගාස්තු රු.1,642,154 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.96,820 ක් වූ ඌනතාවය උච්චාවචනයන් සහිතව 2016 වර්ෂය වනවිට රු.1,153,359 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් ගැලපීමෙන් පසු 2012 වර්ෂයේදී රු.3,623,317 ක්වූ දායකත්වය 2016 වර්ෂය වනවිට රු.7,117,247 දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

------------------

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 03 කොටසෙහි 18 වගන්තිය ප්‍රකාරව, ආයුර්වේද වෛද්‍ය සභාවේ ප්‍රධාන අරමුණු පහත පරිදි විය.

* ආයුර්වේදය උගන්වන යම් ආයතනයක් මේ පනතෙහි කාර්යයන් සඳහා ඇමතිවරයා විසින් අනුමත කළ යුතුද යන්න ඇමතිවරයාට නිර්දේශ කිරීම.

* ආයුර්වේද වෛද්‍යවරුන්, ආයුර්වේද ඖෂධ සංයෝජකයින් හා ආයුර්වේද සාත්තු සේවකයින් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම, එසේ ලියාපදිංචි කිරීම් අවලංගු කිරීම හෝ අත්හිටුවීම.

* ආයුර්වේද වෛද්‍යවරුන්ගේ, ආයුර්වේද ඖෂධ සංයෝජකයින්ගේ හා ආයුර්වේද සාත්තු සේවකයින්ගේ වෘත්තීය හැසිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම යන අරමුණුවලට අදාළ ව්‍යවස්ථා සම්පාදනය කිරීම.

ඉහත අරමුණු ඉටුකර ගැනීම පිළිබඳ පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ වෛද්‍යවරු ලියාපදිංචිවීම සියයට 65 ක ප්‍රතිශතයකින් වැඩිවී තිබුණු නමුත් ඩිප්ලෝමාධාරී වෛද්‍යවරු ලියාපදිංචි වීම පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 94 කින් අඩුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී හා ඉකුත් වර්ෂයේදී ව්‍යාජ වෛද්‍යවරු සම්බන්ධව පිළිවෙලින් පැමිණිලි 34 ක් හා පැමිණිලි 71 ක් ලැබී තිබුණි. එයින් පිළිවෙලින් පැමිණිලි 10 ක හා 26 ක විමර්ශන කටයුතු 2017 ජුනි 16 දින වන විටත් අවසන් කර නොතිබුණි. විමර්ෂන කටයුතු අවසන් කර තිබුණු පිළිවෙලින් පැමිණිලි 24 කට හා 45 කට අදාළව පසු විපරම් කිරීමක් සිදුකර නොතිබුණි. ආයුර්වේද පනත හා විනය නියෝග කාලීන අවශ්‍යතාවය පරිදි සංශෝධනය කර නොතිබුණු බැවින් විමර්ශනය කළ බොහෝ පැමිණිලි අවවාද හා උපදෙස් ලබාදීම්වලට පමණක් සීමාවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු කාර්යයන් 11 ක් ඉටු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයුර්වේද වෛද්‍යවරුන් ඉල්ලීම් කරනු ලබන අවස්ථාවලදී, සභාවේ ලියාපදිංචි කිරීමේ සහතිකය ඉංග්‍රීසි මාධ්‍යයෙන් නිකුත් කිරීමට තීරණය කර තිබීම හේතුවෙන් පැරණි සහතික පත් 1,910 ක් අවලංගු කර ඒ වෙනුවට 2015 වර්ෂයේදී රු.38,454 ක් වැයකර නව සහතිකපත් 500 ක් මුද්‍රණය කර තිබුණි. එහෙත් මුද්‍රණය කරන ලද නව සහතිකයේ අඩුපාඩු පැවතීම හේතුවෙන් ඒවා නිකුත්කර නොතිබුණි.

(ආ) ආයුර්වේද වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය යාවත්කාලීන කිරීමේදී නව සහතිකයක් නිකුත් කිරීමටත්, එම සහතික පත් 6,000 ක් මුද්‍රණය කිරීමටත් 2015 වර්ෂයේදී තීරණය කර තිබුණු නමුත් 2017 අගෝස්තු මාසය වන විටත් නව සහතික පත් මුද්‍රණය කර ගැනීමට අපොහොසත්වී තිබුණු බැවින් 2015 හා 2016 වර්ෂවල ලියාපදිංචිය යාවත්කාලීන කරගැනීමට මුදල් ගෙවා තිබුණු වෛද්‍යවරු 3,469 දෙනෙකු වෙත අදාළ ලියාපදිංචි සහතික නිකුත් කිරීමට නොහැකිවී තිබුණි.

(ඇ) පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ලිඛිත පරීක්ෂණය වාර්ෂිකව පැවැත්වීමට ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු නමුත්, 2014 වර්ෂයෙන් පසු එම ලිඛිත පරීක්ෂණය 2016 මැයි 02 දින පවත්වා තිබුණි. එම විභාගයට අයදුම්පත් 519 ක් ඉදිරිපත් කර තිබුණු අතර අයදුම්කරුවන් 401 ක් දෙනෙකු පරීක්ෂණයට ඉදිරිපත්වී තිබුණි. නමුත් 2017 ජුනි 16 දින දක්වාම විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට සභාවේ ලියාපදිංචිවී සිටින වෛද්‍යවරුන්ගෙන් තොරතුරු සොයාගත නොහැකි වූ වෛද්‍යවරු 1,624 දෙනෙකු පිළිබඳව සභාව අප්‍රමාදව කටයුතු නොකිරීම නිසා එම ලියාපදිංචි අංක භාවිතාකර ව්‍යාජ වෛද්‍යවරු කර්මාන්තයේ නියැලීමට ඉඩකඩ පවතින බව නිරීක්ෂණය විය

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-------------------------

සභාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ලැබී තිබුණු මුදල් අදාළ කාර්යයන් සඳහා යොදවා ගැනීමකින් තොරව 2015 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.4,311,989 ක් හා සමාලෝචිත වර්ෂයේදී දෙසැම්බර් 31 දිනට රු.5,406,214 ක් බැංකු ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සභාවේ 2016 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන මාස 03 යි දින 15 ක ප්‍රමාදයක් සහිතව 2017 ජුනි 15 දින ඉදිරිපත් කර තිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

------------------------------

සමාලෝචිත වර්ෂයේ ආදායම් අයිතම 17 කින් අයිතම 11 ක ආදායම අයවැයගත ආදායම සමඟ සැසඳීමේදී සියයට 3 සිට සියයට 100 දක්වා පරාසයකද, වියදම් අයිතම 30 කින් අයිතම 05 ක වියදම අයවැයගත වියදම සමඟ සැසඳීමේදී සියයට 2 සිට සියයට 123 දක්වා පරාසයකද අවාසිදායක විචලනයන් නිරීක්ෂණයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

-------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය පරිදි වෛද්‍ය සභාවේ 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2017 අගෝස්තු 10 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6 පද්ධති හා පාලනයන්

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන සහතිකපත් මුද්‍රණය කර නොතිබීම හා ප්‍රමාණවත් සහතික පත් තොගයක් පවත්වා ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.